# ප්‍රධාන ලේකම් කාර්යාලය-වයඹ

<u>භාවිතා කරන ලද වාහන හා වාහන සුන්බුන් වශයෙන් විකිණීම සඳහා ලංසු ආරාධනාව.</u>

වයඹ පළාත් සභාවේ රාජ්‍ය ආයතන වල භාවිතයෙන් ඉවත් කරන ලද, වාහන සුන්බුන් හා ලියාපදිංචි රථ ලෙස පහත පරිදි විවෘත ලංසු මඟින් විකිණීම පිණිස මිල ගණන් කැඳවනු ලැබේ.

**සුන්බුන් වශයෙන් විකිණීමට හඳුනාගන්නා ලද වාහන**

| අනු අංකය | ලොට් අංකය | වාහන පංතිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ලේඛන ගාස්තු මුදල (රු.) | ආපසු ගෙවන තැන්පතු මුදල (රු.) | වාහන ගාල්කර ඇති ස්ථානය හා විමසීම් |
|---|---|---|---|---|---|
| 1 | J-01 | JEEP | 3,000.00 | 25,000.00 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වාරියපොල විමසීම : 037-2222325 |
| 2 | J-02 | JEEP | 3,000.00 | 25,000.00 | වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය දකුණු,රවුම්පාර, කුරුණෑගල විමසීම : 037-2222538 |
| 3 | ML-01 | MOTOR LORRY | 3,000.00 | 25,000.00 | |
| 4 | ML-02 | MOTOR LORRY | 3,000.00 | 25,000.00 | |
| 5 | V-01 | VAN | 3,000.00 | 25,000.00 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු විල්ගොඩ පාර, කුරුණෑගල විමසීම : 037-2223479 |
| 6 | MC-01 | CAB | 3,000.00 | 25,000.00 | |

**ලියාපදිංචි රථ ලෙස විකිණීම සඳහා හඳුනාගන්නා ලද වාහන**

| අනු අංකය | වාහන අංකය | වාහන පංතිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු නොගෙවන ටෙන්ඩර් ලේඛන ගාස්තු මුදල (රු.) | ආපසු ගෙවන තැන්පතු මුදල(රු.) | වාහන ගාල්කර ඇති ස්ථාන හා විමසීම් |
|---|---|---|---|---|---|---|
| 1 | 16-8246 | MOTOR CAR | 1990 | 3,000.00 | 50,000.00 | සමාජ සේවා දෙපාර්තමේන්තුව පළාත් සභා සංකීර්ණය කුරුණෑගල විමසීම : 037- 2223484 |
| 2 | KE-5954 | MOTOR CAR | 2007 | 3,000.00 | 50,000.00 | සමුපකාර දෙපාර්තමේන්තුව පළාත් සභා සංකීර්ණය කුරුණෑගල විමසීම :037 -2223568 |
| 3 | 18-1989 | MOTOR CAR | 1992 | 3,000.00 | 50,000.00 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් සභා සංකීර්ණය කුරුණෑගල විමසීම :037-2224075 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | KD-1100 | MOTOR CAR | 2004 | 3,000.00 | 50,000.00 | මානව සම්පත් සංවර්ධන අධිකාරිය<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල<br>විමසීම් :037-2225340 |
| 5 | 52-1714 | VAN | 1991 | 3,000.00 | 50,000.00 | ප්‍රධාන ලේකම් කාර්යාලය<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල<br>විමසීම් :037 -2222234 |
| 6 | 41-1120 | VAN | 1985 | 3,000.00 | 50,000.00 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු<br>විල්ගොඩ පාර, කුරුණෑගල<br>විමසීම් : 037-2223479 |
| 7 | KD-3057 | VAN | 2006 | 3,000.00 | 50,000.00 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු<br>විල්ගොඩ පාර, කුරුණෑගල<br>විමසීම් : 037-2223479 |
| 8 | KE-3279 | JEEP | 2007 | 3,000.00 | 50,000.00 | පළාත් මාර්ග අමාත්‍යාංශය<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල<br>විමසීම් :037 -2221456 |
| 9 | 31-6164 | JEEP | 1981 | 3,000.00 | 50,000.00 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>වාරියපොල<br>විමසීම් : 037 2222325 |
| 10 | 52-4458 | CAB | 1991 | 3,000.00 | 50,000.00 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු<br>විල්ගොඩ පාර, කුරුණෑගල<br>විමසීම් : 037-2223479 |
| 11 | PB-6787 | LORRY | 2008 | 3,000.00 | 50,000.00 | සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල<br>විමසීම් : 037- 2223484 |
| 12 | PW-4344 | BATTA LORRY | 2013 | 3,000.00 | 50,000.00 | මානව සම්පත් සංවර්ධන අධිකාරිය<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල<br>විමසීම් :037-2225340 |
| 13 | GK-7633 | MOTOR TRICYCLE | 2001 | 3,000.00 | 50,000.00 | වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය<br>දකුණු,රවුම්පාර, කුරුණෑගල<br>විමසීම් : 037-2222538 |
| 14 | GN-1857 | BOWSER | 2001 | 3,000.00 | 50,000.00 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු<br>විල්ගොඩ පාර, කුරුණෑගල<br>විමසීම් : 037-2223479 |

02. විකිණීමට නියමිත වාහන **2026.09.11** දින සිට **2026.10.12** දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව **9.00** සිට **ප.ව.3.00 දක්වා** ඉහත සඳහන් කර ඇති ස්ථානයන්හිදී ඊට අදාල දුරකථන අංකය හා සම්බන්ධ වී පරික්ෂා කර බැලිය හැකිය.

03. **2026.09.11** දින සිට **2026.10.12** දින දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව.3.00 දක්වා** ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් (විදුසර දොරටුව, දෙවන මහල) විස්තර පත්‍රිකාව සහ ලංසු ලේඛන ලබා ගත හැකි අතර ඒ සඳහා නියමිත ලංසු ලේඛන ගාස්තු ගිණුම් අංශයේ සරප් වෙත ගෙවා ලදුපත ඉදිරිපත් කළ යුතුය. මෙම කාලය තුලදීම ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කළ හැකි අතර **එක් ලංසු ලේඛනයකින් එක් වාහනයක්/එක් සුන්බුන් වාහනයක් සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතුය.**

04. ලංසු ඉදිරිපත් කරනු ලබන ඒ ඒ වාහනය වෙනුවෙන් ඊට අදාල ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ගෙවා, ඒ සඳහා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් අදාළ ලංසු ලේඛන සමඟ අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. වාහන කිහිපයක් වෙනුවෙන් තැම්පතු මුදල් ගෙවීමේදී ඒ සඳහා එක් ලදුපතක් පමණක් සරප් අංශයෙන් නිකුත් කරනු ලබන අතර ඒ ඒ ලංසු ලේඛන සමඟ එහි ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුය.

05. මීට පෙර වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදු කල වාහන විකිණීම් හිදි සාර්ථක ලංසුකරුවෙකු ලෙස තේරි පත් වී,එහෙත් ඒවා පිරිනැමූ පසු මිලදි ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබූ ලංසුකරුවන්ගේ මිල ගණන් ඉදිරිපත් කිරීම් මෙවර පිළිගනු නොලැබේ.

06. සාර්ථක ලංසුකරුවන් වෙත ඒ බව ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලබන අතර ලිපියෙහි සඳහන් දිනට පෙර ලංසු වටිනාකමට සමාන සම්පූර්ණ මුදල වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත **"මුදලින්"** ගෙවා එහි සඳහන් දිනට පෙර වාහන අදාල ස්ථාන වලින් ඉවත් කර ගැනීම සිදුකල යුතුය.

07. එක් එක් වාහනය/සුන්බුන් වාහනය සඳහා වෙන වෙනම ලංසු ලියවිලි ඉදිරිපත් කල යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන් වෙන්ව කවර වල වාහන අංකයද සමඟ සඳහන් කර මුද්‍රා තබා ඉන් පසුව ඒවා එක් ලියුම් කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"අංක .................. (වාහනයේ අංකය/ලොට් අංකය) දරණ භාවිතා කරන ලද වාහන හා වාහන සුන්බුන් විකිණීම සඳහා මිල ගණන් කැඳවීම-2026 "** යනුවෙන් සඳහන් කර **2026.10.13** දින **පෙ.ව. 10.00** ට පෙර **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය (වයඹ) ,ගිණුම් අංශය (විදුසර දොරටුව,දෙවන මහල),පළාත් සහා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීමට කටයුතු කල හැකිය.තැපැල් මගින් සිදුවන ප්‍රමාදයන් සඳහා වග කියනු නොලැබේ.

08. **2026.10.13** දින **පෙ.ව 10.00**ට ලංසු භාරගැනීම අවසන් වන අතර වහාම ලංසු පෙට්ටිය මුද්‍රා තැබේ. ඒ සමඟම වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ **"ලිච්ඡවි ශාලාවේදී"** ලංසු මිල ගණන් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුට සහභාගි විය හැකි අතර යම් හෙයකින් ලංසුකරු සහභාගි නොවන්නේනම් පමණක් ඒ වෙනුවට එක් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

09. සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරුවන් අතරින් ඉහළම මිල ඉදිරිපත් කර ඇති ලංසුකරු සඳහා පමණක් වාහනය විකිණීම සිදු කරන අතර, යම් හෙයකින් ඔහු විසින් මිලදි ගැනීම ප්‍රතික්ෂේප කලහොත් ඒ සඳහා වෙනත් ලංසුකරුවකු සලකා බැලීම සිදු නොකරයි.

10. මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන ලේකම් කාර්යාලයේ පහත දූරකථන අංක හා සම්බන්ධ වීමෙන් ලබා ගත හැක.

ප්‍රධාන ලේකම් කාර්යාලය - 037-2222234
ගණකාධිකාරි- ප්‍රධාන ලේකම් කාර්යාලය - 037-2223332

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ**
**වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,**
**කුරුණෑගල.**